# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1641/51 – 2010 පෙබරවාරි 19 වැනි සිකුරාදා – 2010.02.19**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය, ජීවන් කුමාරණතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නීරවියාඩි - ජේ/101, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වන්නාර්පන්නයි නිරිත යාපනය නගර සභා සීමාව තුළ වෝර්ඩ් නො. 23 ගමේ පිහිටි යාපනය දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක. යා/ජේඑෆ්එෆ්/2004/099 හා 2005.02.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1555 ක් පමණ වන පහත නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි 03 ට මායිම්.

01. **කැබලි අංක 1 – නයනාදේවන් වලව්, පේතන් වලව් – ප්‍රමාණය: හෙක්. 0.0042**

02. **කැබලි අංක 2 – නයනාදේවන් වලව්, පේතන් වලව්, වරි. අංක 60/6, විද්‍යාල පාර – ප්‍රමාණය: හෙක්. 0.0717**

උතුරට: කැබලි අංක 3 සහ සොක්කර වලව්; නැගෙනහිරට: සොක්කර වලව් සහ යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය; දකුණට: හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය සහ කැබලි අංක 3; බටහිරට: කැබලි අංක 3.

03. **කැබලි අංක 3 – නයනාදේවන් වලව්, පේතන් වලව්, වරි. අංක 60/5, විද්‍යාල පාර – ප්‍රමාණය: හෙක්. 0.0796**

උතුරට: විද්‍යාල පාර, කැබලි අංක 1 සහ 2; නැගෙනහිරට: කැබලි අංක 2 සහ යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය; දකුණට: යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය; බටහිරට: යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය සහ විද්‍යාල පාර.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2004/ඊ/14.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: එන්ජ්එල්/ඩීඑස්/03/ඒඑල්/01.
2009 සැප්තැම්බර් මස 22 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 211